කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015 (පුනර් පරීක්ෂණය)

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# සිංහල

## නාට්‍ය කලාව , නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා SINH E - 1015

පළමුවන ප්‍රශ්නය ද ,දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

① පහත සඳහන් පද්‍ය නිර්මාණය රසාස්වාදය කරන්න.

හිමි ඔබ සයුර මැද රැඳු සටනක ය     රැයේ
පොල් අතු පැලේ මම තනිය ම වෙසෙමි     බියේ
ඇති මුත් හුරු පුරුදු එඩිතර ගතිය     ළයේ
තරමක සැකයකිනි ඔබ අද හවස     ගියේ

අහසේ අඳුරු පැහැ වැහි කළු නගින     කොට
සුළඟේ වෙනස මෙහි ගහ කොළ කියන     කොට
ගෙරවිලි සහිත විදුලිය හඬ ඇසෙන     කොට
හිමියනි මගේ හිත වාවනු බැරි ය     මට

හබලට ඔබේ සවිබල අත රිදෙන     වද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ නගින     වද
සීතල සුළඟ රළුවට ඇඟ වැදෙන     වද
හිමියනි වෙහෙස නිදි මත දෙක දැනෙන     වද

ගොඩ බිම කොහෙ ද නැති මහ මුහුදෙහි     ඈත
හිමි ඈත වෙහෙසෙමින් වෙහෙසී ඇති     දෑත
ඔබ නැති නිසා හිමියනි මේ ළඟ     පාත
සුළඟේ මැකී යයි මගෙ දුක් මුසු     ගීත

එළියක් පෙනෙන විට හිමියනි වෙරළ     බඩ
නැතහොත් දැනෙන විට ඔරුවක් ඇදෙන     හැඩ
දෙ සවන වැටෙන විට කිසිවකු නගන     හඬ
මා නො දැනුවත් ව ම මම මගෙ දෙ පය     උඩ

වැහිපොද මගෙ හිමිගෙ හිස මත නො වැටේවා
මේ රුදු සුළඟ් රැළි රළ පිට නො ගැටේවා
පැද යන ඔරුව වෙත මසු කැල දැවටේවා
ලන ඇම ගිලින තරමට උන් රැවටේවා

ඔබ එනතුරා නැත මගෙ හිත සැනසෙන්නේ
මා ගැන නොවෙ ද හිමි මේ හැටි වෙහෙසෙන්නේ
සවසට යාමටයි ඔබ උදයට එන්නේ
මෙහෙම ද ජීවිතේ දිගට ම ගත වෙන්නේ

ඔබ මහ මුහුද මැද තනිය ම වෙසෙන කල
සිහියට නැගෙනු ඇත මෙහි මා නිදන පැල
හිමියනි ඔබට මගෙ හදවත මිහිරි කළ
සැනසුම තිබේ මේ පොල් අතු කුටිය තුළ

## II කොටස

② කොළඹ යුගයේ ආරම්භක කවිපරපුර වස්තුවිෂය වෙතින් පළ කළ නව්‍යතා කවරේදැයි නිදසුන් සහිතව විභාග කරන්න.

③ සිංහල කවියෙහි ප්‍රගමනයට කුමාරතුංග මුනිදාස කවියාගෙන් වූ මෙහෙවර පිළිබඳ ඇගයීමක් කරන්න.

නැතහොත්

පහත සඳහන් කවීන් අතරින් එක් අයෙකුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමක් කරන්න.

- i ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
- ii මහගමසේකර
- iii රත්න ශ්‍රී විජේසිංහ
- iv ගුණදාස අමරසේකර

④ නාට්‍ය කලාව, අවශේෂ දෘශ්‍යකලා මාධ්‍යයන්ගෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

⑤ ප්‍රභුවරුන්ගේ කාමභෝගී ජීවිතය උපහාසයට ලක්කිරීමෙහිලා රත්නාවලී නාට්‍ය රචකයා දැක්වූ කුසලතාව කෙබඳු දැයි සනිදර්ශනව පහදන්න.

## III කොටස

⑥ "කිසියම් සිද්ධියක් රසවත්ව ඉදිරිපත් කිරීම කෙටිකතා රචකයාගේ කාර්යයයි." මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

⑦ පහත සඳහන් කෙටිකතා අතරින් එක් කෙටිකතාවක් විචාරයට ලක් කරන්න.

(නව නිර්දේශය)

i ගමනාන්තය
ii නොරත රත
iii අවාරේ
iv සමුද්‍ර බාදනය

(පැරණි නිර්දේශය)

i කෙස්වැටිය
ii ගල් පිළිමය හා බොල් පිළිමය
iii අපටත් වැසිකිලියක්
iv මංගල රැස්වීම

⑧ "පාඨකයාගේ විශ්වසනීයත්වය ආරක්ෂා වන පරිදි කථා ප්‍රවෘත්තිය විකාශනය කිරීම නවකතා රචකයාගේ ප්‍රධාන ගුණාංගයකි., සාකච්ඡා කරන්න.

⑨ තෘෂ්ණාහරණ නවකතාවෙහි සාර්ථකත්වය කෙරෙහි එහි චරිත නිරූපණය මගින් සැපයී ඇති පිටුබලය කෙබඳු දැයි නිදසුන් සහිතව පහදන්න.

*****************************

( සෑම පිළිතුරකටම ලකුණු 20 බැගින් ප්‍රදානය කෙරේ)